**මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව**

**------------------------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 ජූනි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

**------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විගණනය සඳහා ගෙවිය යුතු රු. 16 ,000 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශයේ ප්‍රතිපාදන සලසා නොතිබිණ.

(ආ) වාහන සඳහා බල පත්‍ර සහ රක්ෂණ සහතික ලබා ගැනීම සඳහා වැය කළ රු. 14 ,073 ක මුදල ප්‍රාග්ධන වියදම් ලෙස පෙන්නුම් කර තිබුණි.

(ඇ) 2014 දී යුනොප්ස් (UNOPS) ආයතනයෙන් පරිත්‍යාග වශයෙන් ලබා ගන්නා ලද ට්‍රැක්ටර් ටේලර් දෙකක වටිනාකම තක්සේරු ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලබා ගත යුතු රු 167,580 ක මුදල මූල්‍ය ප්‍රකාශනයේ 1989 වර්ෂයේ සිට දිගටම පෙන්නුම් කෙරෙන නමුත් එය අය කර ගැනීමට හෝ ගිණුමෙන් කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මුළු වටිනාකම රු.103,312,993 කින් යුත් ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ ආදිය සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි.

**1.3.4 නීති රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| | (i) 1 පරිච්ඡේදයේ 5(12) රීති | මුදල් සහ ගබඩා වගකීම් රාජකාරි මට්ටමෙන් නිලධාරීන් තුන් දෙනෙකුට භාරදී ඇතත් එම අයගෙන් සුරැකුම් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| | (ii) X පරිච්ඡේදයේ 193 රීති | සමාලෝචිත වර්ෂයේදී තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් අදාල විස්තර අයවැය ලේඛනය සමඟ සසඳා බලා විෂමතාවලට අදාල හේතු හා විස්තර ඇතුළත් කොට ප්‍රකාශනයක් සකස් කොට විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකරන ලද මාස 06 ක් ඉක්මවූ රු.19,967 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.30,429, 948 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.6,714,577 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,715,371 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් කළමනාකරණය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

පහත සඳහන් අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභාව මගින් ආදායම් රැස් කර ගැනීම පිණිස අතුරු ව්‍යවස්ථා නීතිගත කිරීමට අසමත් වූයෙන් සභා බල ප්‍රදේශය

තුළ පිහිටුවා ඇති සන්නිවේදන කුළුණු 12 ක් වෙනුවෙන් බදු අය කිරීමට නොහැකි වූයෙන් සභාවට ආසන්න වශයෙන් අවුරුද්දකට රු.600,000 ක මුදලක් අහිමි වී තිබුණි.

(ඈ) කළුවාන්චිකුඩි පොදු වෙළෙඳ සැල් සංකීර්ණයේ කඩ 19 ක් කුලියට ලබා ගත් අයගෙන් 1991 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා කාලයට අදාල කුලී හිඟ මුදල රු.92, 676 ක් අය කර ගැනීමට හෝ ලේඛනවලින් ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සභාවට දෙන ලද මෝටර් රථ 04 ක හිමිකම් සභාවේ නමින් මාරු කර ගැනීමට අවුරුදු 04 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයිති ආයුර්වේද රෝහලට වෛද්‍ය නිලධාරි සහ ඖෂධ සංයෝජක කෙනෙකු පත් කර ගැනීමට මහා භාණ්ඩාගාරය මගින් 2013 ජනවාරි 01 දින අනුමැතිය දී තිබුණත් එසේ වෛද්‍යවරයෙකු පත් කොට ජනතාවට සේවයක් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) අත ඉතිරි භාණ්ඩවලින් මුළු වටිනාකම රු.48,216 ක් වන පොදුවේ පරිහරණය කරන භාණ්ඩ සහ විදුලිය උපකරණ 1989 වර්ෂයේ සිට පාවිච්චි කළ නොහැකි භාණ්ඩ වශයෙන් පෙන්නුම් කර ඇතත් ඒවා ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවේ පොදු වෙළෙඳසැල් 08 කින් 1985 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අය කළ යුතුව තිබුණු හිඟ බදු මුදල වන රු.3,110,486 ක් අය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) සේවක ණය අයකර ගැනීම